**සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම - 2015**

---

සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන්

අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමුවාප්‍ර) වලට අනුකූල වීම.**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ :**

---

ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව, සමාගම විසින් අනාගත වගකීම් ඉටු කිරීම සඳහා එහි විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් ආයෝජනය කර නොතිබුණු අතර නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විධිමත් ආකාරයෙන් ගිණුම් තැබීම සඳහා අනුගමනය කළ යුතු පියවරයන් සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) **ශ්‍රීලංගිප්‍ර 39 - මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මැනීම :**

---

(i) අස්තිත්වයක් විසින් "මූල්‍ය වත්කම්" යටතේ එහි ණය හා ලැබිය යුතු මුදල් හඳුනාගත යුතු අතර, පසුව සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මැනිය යුතුය. කෙසේ වුවද තාප ගල් අඟුරු නැව් බඩු තොගය සඳහා වෙළඳ ණයගැති අත්තිකාරම හා වාෂ්ප ගල් අඟුරු වෙළඳ ණයගැතියන් (ලං වී ම) ආදී මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කර නොතිබුණි.

(ii) වෙළඳපොළ පොලී අනුපාතයට අඩුවෙන් දෙන ලද සේවක ණය, සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනාගත යුතු අතර, ඊට අමතරව වෙළඳපොළ පොලී අනුපාතය හා ණය සඳහා ලැබෙන වෙළඳපොළ පොලී අනුපාතයට අඩු අනුපාතය අතර වෙනස සේවක පිරිවැය ලෙස හඳුනාගත යුතුය. කෙසේ වුවද සමාගම විසින් ප්‍රමිතියේ නියමයන් පරිදි සේවක පිරිවැය හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) **ශ්‍රීලංගිප්‍ර 36 - වත්කම් හානිකරණය :**

---

වත්කමක් හානිකරණය වේ යැයි යම් ඇඟයීමක් තිබේ නම්, එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී, එහි ලැබිය යුතු ශේෂ මත හානිකරණ පරීක්ෂාවක් සෑම අස්තිත්වයක් විසින්ම සිදු කළ යුතුය. ලංකා විදුලිබල මණ්ඩලයෙන් (ලංවිම) සමාගමට ලැබිය යුතු ශේෂ පිළිබඳව සමහර ආරවුල් සමාගම සඳහා පැවතියද, ඒ සඳහා හානිකරණ පරීක්ෂාවක් 2015 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් සිදු කර නොතිබුණි.

**2.2.2. ගිණුම්කරණ අඩුපාඩු**

---

"බොටම් ඇෂ් " සෑදීමේ ව්‍යාපෘතිය (Bottom Ash Making Project) සඳහා දරන ලද රු.264,950 ක් වූ වියදමක්, කළමනාකරණ ගාස්තුවක කොටසක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි. කෙසේ වුවද ගල් අඟුරු සැපයීමේ ක්‍රියාවලියට මෙම වියදම සෘජුවම අන්තර්ගත නොවන බැවින් ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කළ නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.3. නොසැසඳු වෙනස්කම්**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල රු.380,343,765 ක් විය. කෙසේ වුවද ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී මුදල රු.734,086,996 ක් විය. එබැවින්, එම මූල්‍ය ප්‍රකාශන දෙක අතර රු.353,743,231 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය බදු පූර්ව ශුද්ධ ලාභයක් හෝ ශුද්ධ පාඩුවක් නොවූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.1,199,036 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,199,036 ක පිරිහීමක් දැක්වුණි. ශුද්ධ පොදු කාර්ය පිරිවැය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සමඟ නව ගිවිසුමකට එළඹීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය තත්ත්වය**

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ විශේෂිත තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| **විෂයය** | **2015** | **2014** | **විචලනය** |
| | රු. | රු. | ප්‍රතිශතය |
| ජංගම නොවන වත්කම් | 2,086,083 | 1,198,955 | 74 |
| ජංගම වත්කම් | 1,070,269,331 | 926,877,382 | 15 |
| මුළු වත්කම් | 1,072,355,414 | 928,076,337 | 15 |
| ජංගම වගකීම් | 1,000,361,221 | 857,013,405 | 16 |
| කාරක ප්‍රාග්ධනය | 69,908,110 | 69,863,977 | 0.06 |
| යෙද වූ මුළු ප්‍රාග්ධනය | 71,994,192 | 71,062,931 | 1.31 |
| ජංගම නොවන වගකීම් | 1,467,783 | 998,647 | 47 |
| ස්කන්ධය | 70,526,409 | 70,064,284 | 0.6 |

ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මුළු වත්කම් සියයට 15 කින් වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ලක් විජය විදුලි බල පිරියත සඳහා ගල් අඟුරු සැපයීම සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය විය. ජෙටියේ සිදුවූ ප්‍රමාදයන් හා යාත්‍රාවේ දොඹකර බිඳ වැටීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ

සමාගමට මෙහෙයුම් දින 40 ක් අහිමි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කාලපරිච්ඡේදය තුළ ගෙවන ලද ප්‍රමාද ගුදම් ගාස්තු සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි.

**4.2 කළමනාකරණ දුර්වලතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා විදුලි බල මණ්ඩලය සඳහා ගල් අඟුරු සැපයීම මෙහෙයවීම සඳහා කළමනාකරණ ගාස්තු සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වේ. කෙසේ වුවද, සමාගමේ දැක්ම, මෙහෙවර හා අරමුණු ඉටු කර ගැනීමට සහ එහි කොටස් හිමියන්ට ප්‍රමාණවත් ප්‍රතිලාභ (ලාභාංශ) ගෙවීමට මෙම ආදායම ප්‍රමාණවත් නොවේ. තවද යම් වෙනත් ආදායමක් අඩුවීමෙන්, කළමනාකරණ ගාස්තුව මුළු පොදුකාර්ය පිරිවැයට සමාන වේ නම්, එය සාංගමික සංස්ථා පත්‍රයේ සඳහන් පරිදි වෙනත් ව්‍යාපාරයන් හෝ කාර්යයන් ඉටු කිරීම මගින් වෙනත් ආදායමක් ඉපැයීමට උද්යෝගය අඩු කරයි.

(ආ) ඕනෑම මූල්‍ය වර්ෂයක් සඳහා වෙනත් ආදායම මුළු පොදුකාර්ය පිරිවැයට වඩා ඉහළ වන විට, කළමනාකරණ ගාස්තුව ගණනය කිරීමේ පදනම සමාගම හා ලංකා විදුලි බල මණ්ඩලය අතර එළඹි ගිවිසුමෙහි ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ගල් අඟුරු පිළිබඳ තත්ත්වය සඳහා දඩමුදල් ගැලපීම් වලට අදාළ ලංසු ලියකියවිලිවල කොන්දේසි, සමාගම සහ සීමාසහිත ලිබර්ටි කොමොඩිටීස් (Liberty Commodities Ltd) (එක් ගල් අඟුරු සැපයුම්කරුවකු) අතර එළඹි ගල් අඟුරු සැපයීමේ ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 හා 2016 වර්ෂයන් තුළදී සමාගම විසින් පිළිවෙලින් රු. 81,573,306 ක් හා රු.148,941,802 ක් වූ වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

(ඈ) සමාගමේ වාර්ෂික චාරිකාව සඳහා රු.1,047,220 ක මුදලක් වැය කර තිබුණු අතර, මෙම වියදම ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා කළමනාකරණ ගාස්තුවට ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද වාර්ෂික චාරිකාවේ පිරිවැය, ගල් අඟුරු ප්‍රසම්පාදන ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය කොටසක් නොවන බවත් කළමනාකරණ ගාස්තු යටතේ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කළ නොහැකි බවත් නිරීක්ෂණය විය. තවද, රජය සතු සමාගමක් වශයෙන් මේ ආකාරයේ වියදම් විගණනයේදී පිළිගත නොහැකි විය.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඳවා ගැනීම් පරිපාටියක් (SOR) පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) තාත්වික සේවක සංඛ්‍යාවක් පවත්වා නොගැනීම හා සේවක සංඛ්‍යා තත්ත්වය කාලීනව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 කින්, ද්විතීය මට්ටමේ තනතුරු 01 කින් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 කින් සමන්විතව පුරප්පාඩු 9 ක් පැවතුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාගම විසින් සේවක සංඛ්‍යාව තුළ "ප්‍රවාහන සහකාර" ලෙස නව තනතුරක් ඇති කර තිබුණි.

(ඇ) විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ලංකා විදුලි බල මණ්ඩලයේ වැටුප් පරිමාණයන්ට අනුකූල වන පරිදි එක් එක් තනතුරු වර්ගයට අදාළව සේවකයන්ගේ වැටුප් සකස් කර ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 විගණන කමිටුව

-----------------

2015 ජුනි 19 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගමේ විගණන කමිටුව ස්ථාපිත කර තිබුණද 2015 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂයයන් 38 කට අදාළව අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 4 සිට සියයට 162 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, වාර්ෂික අයවැය ලේඛනයෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහිතව සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වර්ෂය අවසානයට ශේෂ පත්‍රය සහ අයවැයගත ප්‍රාග්ධන වියදම් ප්‍රකාශනය ඇතුළත් කළ යුතු වුවද සමාගම එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | සමාගමේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා දේපල, පිරියත හා උපකරණ පිළිබඳ අගය කිරීම, ලේඛනගත කිරීම හා ආරක්ෂාව සහ එහි සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීම. |
| (ආ) | ණයගැතියන් පිළිබඳ පාලනය | ප්‍රමාදයකින් තොරව ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අය කර ගැනීම හා ඒවා ගිණුම්ගත කිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | කාර්යභාරය හා ප්‍රමාණය අනුව සමාගමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | මූල්‍ය කළමනාකරණය | ඵලදායී මූල්‍ය කළමනාකරණ උපාය මාර්ග භාවිතා කළ යුතුය. |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | සමාගමේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුය. |